# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**
**மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு**
**Ministry of Women, Child Affairs and Social Empowerment**


| | | |
|---|---|---|
| මගේ අංකය<br>**எனது இல**<br>**My No** DSD/HO/IT/11/e bank | ඔබේ අංකය<br>**உமது இல**<br>**Your No** ………… | දිනය<br>**திகதி**<br>**Date** 2024/02/21 |

**සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්**
**දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරු,/ප්‍රාදේශිය ලේකම්වරු,**
**දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,/ සහකාර අධ්‍යක්ෂවරුන්,**
**සමෘද්ධි බැංකු පාලක මණ්ඩල/විධායක කමිටු සභාපතිවරුන්**
**සමෘද්ධි බැංකු කළමණාකරු,/ සමෘද්ධි බැංකු සමිති කළමණාකරුවන්/ සමෘද්ධි සංවර්ධන නිළධාරි.**

**<u>සමෘද්ධි බැංකු / බැංකු සමිති සඳහා අමතර (Backup) අන්තර්ජාල සම්බන්දතාවයක් ස්ථාපිත කර ගැනීම</u>**

සමෘද්ධි බැංකු පරිගණකගත කිරීමේ කාර්ය අවසන් අදියරට පැමිණ මැනුවල් කාර්යයන් ක්‍රමක්‍රමයෙන් ඉවත් කරමින් පවතී. බැංකුවක සියලු කාර්යයන් පරිගණක මෘදුකාංගයෙන් සිදු කිරීමේදී අඛණ්ඩ අන්තර්ජාල (internet) පහසුකමක් තිබිය යුතුය.

02. අන්තර්ජාල පහසුකම අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා දිවයිනම ආවරණය කර ඇති ප්‍රධාන සේවා දායකයන් වන SLTS මොබිටෙල් හා ඩයලොග් සබඳතා තබා ගැනීම සුදුසුය. සිදු කළ සමීක්ෂණයට අනුව බහුතර බැංකු සංඛ්‍යාවක් SLT මොබිටෙල් සබඳතාවයන් භාවිතා කරන බව නිරීක්ෂණය විය. SLT හා Mobitel එකම ආයතනයකින් සබඳතා සපයන බැවින් දැනට SLT-ADSL පහසුකම් ලබා ගෙන ඇති බැංකු Mobitel සබඳතාවය නොව වෙනත් සේවා දායකයෙකුගේ සබඳතාවයක් Backup සබඳතාවයක් ලෙස තබා ගැනීමට සුදුසුය.

03. මේ සඳහා විශේෂිත පහසුකම් සහිත සබඳතාවය ලබා දීමට ඩයලොග් ආයතනය අප හා එකඟ වී ඇත. හඳුන්වාදෙනු ලබන මෙම සබඳතාවය මගින් මධ්‍යගත පාලනයකට යටත්ව නිකුත් කරන අතර ඔබට ලැබෙන Data ප්‍රමාණය මෘදුකාංග හා සම්බන්ධ වීමට පමණක් යොදා ගැනීමට හැකි වන පරිදි සකස් කර ඇත.

04. මෙම සබඳතාවය සඳහා මූලික ගෙවීමක් සිදු කිරීමට අවශ්‍ය නොවන අතර මාසිකව දිනයේ ඕනෑම වේලාවක 29GB ලැබෙන මාසික ගාස්තුව බදු රහිත 1020/- ක පැකේජයක් හඳුන්වා දී ඇත.

05. ඒ සඳහා ඩයලොග් ආයතනයේ මනෝජ් ප්‍රියංකර මහතා (දු.අ. 0773336278) සමඟ සම්බන්ධ වී ඔබට අවශ්‍ය අමතර අන්තර්ජාල සබඳතාවය ලබා ගත හැකිය. මොබිටෙල් සබඳතා ලබා ගන්නා බැංකු මොබිටෙල් ආයතනයේ ජීවන් මහතා (දු.අ. 0714572623) සම්බන්ධ කර ගත හැකිය.

06. මැනුවල් කාර්ය අවසන් කොට මෘදුකාංගය පමණක් භාවිතයට යෑමේදී සෑම බැංකුවක්ම අන්තර්ජාල සබඳතා 2ක් පවත්වාගෙන යා යුතුය. එමෙන්ම එම අන්තර්ජාල සබඳතාවයන්ගේ ස්ථාවරත්වය හා වේගය ප්‍රධාන කාර්යලයේ සිට පරික්ෂා කල හැකි ආකාරයට තිබිය යුතුය.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

07. මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ඔබ දක්වන සහයෝගය අගය කොට සලකමි.

**සී.ඩී. කළුආරච්චි**

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

| | | |
|---|---|---|
| 01. අධ්‍යක්ෂ(ක්ෂුද්‍ර මූල්‍ය) | - | අ.ක.ස |
| 02. ප්‍රධාන අභ්‍යන්තර විගණක | - | අ.ක.ස |